සියලු ම හිමිකම් ඇහිරිණි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය- කොළඹ 07

**Grade 11–First TermTest – June – 2021**

**පළමු වාර පරීක්ෂණ - 2021 ජුනි - 11 ශ්‍රේණිය**

කාලය : පැය 3
Time :3 hours

Sinhala Literature

සිංහල සාහිත්‍ය රසාසිවාදය

| 47 | S | I /II |
|---|---|---|

Name :- ....................................................Grade : -................ Index number:-....................

**1 කොටසෙහි 1,2 ප්‍රශ්න වලටත් 11 කොටසෙහි තුන් වැනි ප්‍රශ්නයටත් 111 කොටසෙහි 4,5,6,7, ප්‍රශ්න වලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න .**

## 1 කොටස

**(1) (i) සිට (v) දක්වා කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න .**

**(i) "තොපට වරදානයක් දෙමි .කැමති වරයක් ඉල්වා ගනැ "**

(අ ) මේ ප්‍රකාශය කියන ලද්දේ කවුරුන් විසින් කාහට ද ?

(ආ) ඉල්වා ගත් වරය කුමක් ද ?

**(ii) " ගියත් සුළුගෙයි වහා එව "**

(අ ) මෙය කවුරුන් විසින් ප්‍රකාශ කළේ ද ?

(ආ) සුළුගෙයි යනුවෙන් අමතනු ලබන්නේ කවරෙක් හට ද ?

**(iii) " මිනිස් හට සොඳුරු ගුණ සහ නුගුණ ඇත**
**නිදොස් කෙනෙකු <u>මෙදියත</u> උපදනේ නැත**
**වෙසෙස් සිනිඳු මුවරද බර සහස් පත**
**<u>කොරොස් නළින්</u> යුතු වෙයි කටු පෙළිනි යුත**

(අ) ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න .
(ආ) " වෙසෙස් සිනිඳු මුවරද බර සහස් පත "යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න .

**(iv) " මගේ පුතා මේ සුමානේ මැරුණා "**

(අ ) මෙම ප්‍රකාශය කවරෙකු විසින් කරනු ලැබූවක් ද ?
(ආ) ඔහු කුමන කාර්යයක නියැලී සිටියේ ද ? **(ලකුණු 4×5 -20)**

සියලු ම හිමිකම් ඇහිරිණි / *All Rights Reserved*

**(02)** **පහත සඳහන් කවි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කරගෙන රසාස්වාදයක් ලියන්න .**

දකුණේ මෙන්ම උතුරේත් හිරු නඟියි උදේ
රන් තරු රිදී තරු සවසට පෙළට ඇදේ
හඳ ඇති දාට රසබර රැස් දහර හදේ
පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනේ වැදේ

ගෙන එයි මිහිරි ගී මදනල හමන විට
වැටහෙයි නොවැටහුණු සැඟවුණු කරුණු මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව පිට
උදයට පෙනේ බොල් පිණිබිඳු පබලු ඇට

තනි බව දැනේ එහි කෞතුක රසය ඇත
මං පිට ගෙයක බව සලකනු පුරුදු නැත
හැම මොහොතකම ඇති උණුසුම් ගතිය මත
උගතිම් කිමද මිනිසා සතු දෙනෙත තෙත

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනෙකු විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු පසින්
පාලම බැදෙනු ඇත දවසක උතුරු දෙසින්

(i) කවි පෙළට පාදක වී ඇති අත්දැකීම කුමක් ද ?

(ii) කවි පෙළෙහි සාර්ථකත්වයට ඉවහල් වී ඇති කාව්‍යෝපක්‍රම මොනවා ද?

( iii) කවි පෙළ කාලීන වටිනාකමකින් යුතු නිර්මාණයක් බව අගයන්න .

(iv) කවි පෙළෙහි ආකෘතිය හා භාෂාව විමසන්න .

( v) කවියාට මෙතෙක් නො වැටහුණු බව පවසන කරුණ කුමක් ද? (ලකුණු 5×5 -25)

සියලු ම හිමිකම් ඇහිරිණි / *All Rights Reserved*

## 11කොටස

- **පහත සඳහන් ගද්‍ය හෝ පද්‍ය කොටස් දෙකෙන් එක කොටසකට පමණක් පිළිතුරු සපයන්න .**

(03) නන්ද තෙරුන් වහන්සේ ද වහන්දෑගේ කතාවෙන් තරයේ ම ලැජ්ජා ඇතිව දෙවඟනන් කෙරෙහි කළ ආලය හැරී, පෙරළි හන්ට තැබූ දෙයක් නොහෙන ලෙස තනා තබා ගන්නා සේ පෙරළා මහණ දමට ම සිත් සතන් යොමු කොටලා රජ සිරි හැර අවුත් නිවන් සිරි නොවරදවා නිසා නොපමාව වසන සේක. යම් සේ ලේනෙක් තමා සේ ලේනෙක් තමා තරම් කෙනෙකුන් තමාට සතුරු ව ආ කල තමාගේ නගුට කුජ්පවාලා එයින් ගසාලා පහ කෙරේද, එමෙන් ළං වූ කෙලෙස් සතුරු කෙනෙක් ඇත්නම් සතර සීවටන් නැමැති උගුරෙන් මරා පලවෙමින් යම්සේ යම් සේ දිවි දසේ දිවි දෙනක් කෙනෙක් වුවත් එකවර ක වදන පැටවුන් මුත් දෙවන මුරයේ නො වඩා එක මුර යෙන්ම වඳ වේද එපරිද්දෙන් උපන් ජාති විනා හවෝත්පත්තු නැතිවීමට අදහස් ඇතිව ඇතිව යම්සේ දිවියෙක් තණ කැළෑ ආදිය යට වැදලා හිඳ ගොදුරු අල්වා ගනී ද ,එසේම අර්හත් එල නමැති ගොදුරු නිසා ගම්භීරාරණ්‍ය රුක්මුල් , ගල් පාවුලු , කඳු රැලි , ගල්ගුහා, සොහොන අබ වස යනාදියට එළඹ, යම්සේ දිවියා ගොදුරු අල්වා ගත් කලට වමැළයෙන් හුනු ගොදුරු නොකා ද එපරිද්දෙන් එක්විසි අන්වේෂණ වශයෙන් වේවා යි' වාග් විභජ්ති වශයෙන් වේවා යි ,උපන් දෙයක් ඇත්නම් විෂ මිශ්‍රයක් පරිද්දෙන් හැර විදසුන් වඩා රහත් එල නමැති වොටුනු පැළඳීමෙන් හැර ආ රාජාභිෂේකයට රාජ්‍යාභිෂේකයක් ලදින් හැර පියා ආ ගෙමගුල් කොට හැර ආ විවා මගුලට එල සමවත් විවා මඟුල් කොට බුදුන් සන්තක නිවන් රට තමන් වහන්සේට හිමි කළ සේක .

එක් දේවතාවෙක් රාත්‍රී වේලෙහි දෙව්රම් වසන බුදුන් කරා ගොසින් වැඳ ලා ස්වාමීනි, මුඹ වහන්සේ ගේ මල් වූ වූ නන්ද මහ තෙරුන් වහන්සේ රහත් වූ සේකැ' යි කිවු ය .ඔහු නො කියන තෙක් ම බුදුහුන් දෙව්ලොව ගිය ගමනින් ම සසර ගමන් නිමවා රහත් වූ නියාව විමස විමසා හිදිනා සේක් එසේම දත් සේක. නන්ද මහ තෙරුන් වවහන්සේ ද රාත්‍රිය පාන් වූ කල්හි බුදුන් කරා ගොසින් වැඳ ලා "ස්වාමීනි මුඹ වහන්සේ දෙව්ලොව වැඩි ගමනේ දෙවඟනන් පන්සියයක් මා ලබන නියාවට වූ ඇපයෙක් ඇත්තේ වේද, මෙවක් පටන් දෙවඟනන් තබා කිසිවකත් මාගේ ඇල්මක් නැති හෙයින් ඒ ඇප නැතැයි නැතැ'යි කී සේක ."

(i) ඡේදයේ කියවෙන ආකාරයට නන්ද තෙරුන් වහන්සේ දෙවඟනන් කෙරෙහි පැවති ආලය අත්හැර දමා සිත් ඇතිකර ගත්තේ කුමක් සඳහා ද. ? (ලකුණු 05)

(ii) බුදුරජාණන් වහන්සේ වෙත නන්ද තෙරුන් රහත් වූ පණිවිඩය රැගෙන ආවෝ කවුරුන් ද ? (ලකුණු 05)

(iii) බුදුරජාණන් වහන්සේ නන්ද කුමාරයාට වූ ඇපය කුමක්ද ? (ලකුණු 05)

(iv) නන්ද තෙරුන් වහන්සේ රහත් බවට පත් වූ ආකාරය දැක්වීමට කතුවරයා යොදාගෙන ඇති උපමා හතරක් ලියා දක්වන්න . (ලකුණු 10)

(මුළු ලකුණු 25)

සියලු ම හිමිකම් ඇහිරිණි / *All Rights Reserved*

**නැතහොත් ,**

**"හිස නමා ගති ඇ**
**සිහින් රතැඟිලි පටලවාගති**
**සතියකට පෙර ගෙනාවර**
**විලිබරය මගෙ රන්වන් මනාලිය.**
**දැල් තිර අස්සෙන්**
**පෙනෙයි ඇ ඔබ යනු මොබ එනු**
**පට පිළි ගෙන ආභරණ පෙට්ටි ගෙන,**
**ඇසෙයි නොපෙනෙන විටත්**
**සාලයෙන් කාමරයට**
**කාමරයෙන් සාලයට**
**යන පා හඬ ,මා වෙත එතත් ඇ**
**උවමනාවක් කිසිත් නැතිව ද**
**නොරැදෙයි , පලා යෙයි,**
**ගෑ විලවුනෙහි**
**නැත, රන්වන් සමෙහි හෙළන සුස්මෙහි  සුවඳ ය ඒ,**
**ඇ බඳ සුවඳ දැනෙන්නේ මට විතරද?**
**පෙනෙයි ඇ**
**ඇසෙයි**
**දැනෙයි**
**මට ගේ හැම තැනම..."**

(i) මෙහි සඳහන් වන මනාලියගේ විලිබර බව ඉස්මතු කෙරෙන අවස්ථා දෙකක් ලියා දක්වන්න . (ලකුණු 05)

(ii) මනාලයාගේ සිතෙහි ඇ තුළ පවතින බැඳීම සංකේතවත් කරන කාව්‍යෝක්ති දෙකක් උපුටා දක්වන්න . (ලකුණු 05)

(iii) කවියා යොදාගත් භාෂාව සහ එහි ආකෘතිය පද්‍යා පන්තියේ සාර්ථකත්වයට හේතු වූ අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න . (ලකුණු 05)

(iv) චිත්ත රූප මැවීමට ජී. බී. සේනානායකයන් දැක්වූ දැක් වූ දක්ෂතාවය කෙටියෙන් පැහැදිලි කරන්න . (ලකුණු 10)

**( මුළු ලකුණු 25)**

සියලු ම හිමිකම් ඇහිරිණි / *All Rights Reserved*

## III - කොටස

✵ **ප්‍රශ්න අංක 4 සිට 7 දක්වා ප්‍රශ්න වලින් තෝරාගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් පිළිතුරකට වචන 150 ක් වත් තිබිය යුතු ය.)**

**(4)** විවිධ මිනිස් දුර්වලතා හාස්‍යය සහ උපහාසය ධ්වනිත වන අයුරින් සුභාෂිතය කතුවරයා ඉදිරිපත් කර ඇති ආකාරය නිදසුන් දෙමින් විමසන්න . (ලකුණු 15)

(5) වෙසක් පහන කෙටිකතාවේ එන සිද්ධි මනා ලෙස ගළපා තිබීම කතාවේ සාර්ථකත්වයට ඉවහල් වී තිබෙන අයුරු විමසීමට ලක් කරන්න . (ලකුණු 15)

(6) ගැමි සිතක පවතින අව්‍යාජ බව විමලරත්න කුමාරගම කවියාගේ ආගන්තුක සත්කාරය පද්‍ය පන්තිය ඇසුරෙන් විමසන්න . (ලකුණු 15)

(7) ජාතක කතාකරුවා අපූරු චිත්ත රූප මැවීමට සමතෙකි. කුස ජාතකය ඇසුරෙන් නිදසුන් දෙමින් පැහැදිලි කරන්න (ලකුණු 15)